වැලිගෙපොල ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 11 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය
------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
ii. අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා අතර සන්සන්දනාත්මක ප්‍රකාශයක්.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු. 53,206,461 ක වියදම් දරා ඉදිකරන ලද උතුරු හුණුවල හා පැලැන්දකන්ද ජල යෝජනා ක්‍රමය වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ප්‍රදාන හා ණය වශයෙන් ලද ප්‍රතිපාදන රු. 49,456,206 ක් සභා අරමුදලින් බැහැර ගිණුමක් මාර්ගයෙන් වැය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයන්ට ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් උතුරු හුණුවල හා පැලැන්දකන්ද ජල යෝජනා ක්‍රමය සඳහා ලබාගත් ණය මුදල රු. 18,156,065 ක් සභාවේ ණය ප්‍රාග්ධන වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) උක්ත ණය මුදලේ පළමු අදියර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 675,194 ක පොලී මුදලක් ගෙවිය යුතු වුවද, ඒ සම්බන්ධයෙන් ආදායම් හා වියදම් ගිණුමට වියදම් ලෙස ගැලපීමක් සිදුකර නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පළමු අදියරේ ණය මුදල වෙනුවෙන් පසුගිය වර්ෂයන්ට අදාලව ගෙවිය යුතු පොලී මුදල රු. 1,583,341 ක් වුවද, ඒ සම්බන්ධයෙන් සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) උක්ත ණය මුදලේ දෙවන අදියර වෙනුවෙන් 2013 වර්ෂයේදී රු. 841,243 ක පොලී මුදලක් ගෙවිය යුතු වුවද, 2013 අප්‍රේල් 22 දින දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවන ලද පොලිය රු. 282,134 ක් වූයෙන් ගෙවිය යුතු පොලිය රු. 559,109 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසය තෙක් සියළුම උසාවි දඩ ආදායම් රු. 2,042,123 ක් සහා අරමුදලට ලැබී තිබුණි. ඒ අනුව තවදුරටත් ලැබිය යුතු වූ රු.105,416 ක් හඳුනාගෙන තිබියදීත් 2013 වර්ෂයේ බිල්කල ආදායම රු. 3,500,000 ක් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් වශයෙන් දැක්වීමෙන් ආදායම් හා ණයගැති ශේෂය අධි වෙන්කිරීමක් ලෙස නිරූපණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසය තෙක් මුද්දර ගාස්තු ආදායම් රු. 966,000 ක් සහා අරමුදලට ලැබී තිබූ නමුත්, 2013 වර්ෂයේ බිල්කල ආදායම වූ රු. 5,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් වශයෙන් දැක්වීමෙන් ණයගැති ශේෂය අධි වෙන්කිරීමක් ලෙස නිරූපණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන ඇති රු. 107,428 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම හරහා ස්ථාවර වත්කම් ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

(එ) දේපල පිරියත උපකරණ ගිණුම් හා ප්‍රාග්ධන යෙදුමට ආදයමින් දායක වීමේ ගිණුම අතර පැවති රු. 89,023 ක වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්.

---------------------

වර්ෂ 09 ක පමණ සිට පැවත එන රු. 1,504,812 ක ණයහිමි ශේෂයන් ගිණුම් වලින් දක්වා තිබුණද,එම ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන ගිණුම් වල දක්වා ඇති ණයහිමි ශේෂය වූ රු. 3,255,947 න්, රු. 1,510,043 ක් විගණිත දිනය වූ 2014 මැයි මස 07 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|
| (අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | |
| (I) 132(ඕ) | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු. 50,000 ක් වැයකර ප්‍රජා ශාලාවක් අසල බුදුමැදුරක් ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිල්ලක කොටසක් ඉදිකර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (I) | මුදල් රෙගුලාසි අංක 371(2) ඇ | 1988 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අවස්ථා 168 කදී ලබා දුන් රු. 2,371,861 ක් වූ අත්තිකාරම් විගණිත දිනය වනතුරුම පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 570 හා 571 | 1995 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා එකතුව රු. 1,022,121 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 3,784,070 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 686,904 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 3,097,166 කින් හෙවත් සියයට 450 කින් වැඩිවී ඇති අතර, ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් අයහාර ආදායම් (වරිපනම් හා බදු, සේවා සඳහා ගාස්තු, දඩ හා වරෙන්තු ගාස්තු) වැඩිවීම බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,271 | 2,682 | 1,393 |
| බදු කුලී | 938 | 758 | 113 |
| බලපත්‍ර ගාස්තු | 530 | 765 | 30 |
| වෙනත් ආදායම් | 11,955 | 10,463 | 8,500 |

2.3.2 ජල ගාස්තු

--------------

ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන ජල සේවය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 2,464,559 ක ආදායමක් ලැබී තිබුණි. ඒ සඳහා සභාව විසින් රු. 3,953,146 ක වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ජල සැපයුම් ආදායමට වඩා රු. 1,488,587 ක් වියදම් දරා තිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

ඉඩම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම 2013 මාර්තු මාසයෙන් පසුව හඳුනා ගැනීමට හෝ ආදායම සභාවට අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම බලංගොඩ මහේස්ත්‍රාත් අධිකරණය මඟින් ලැබිය යුතු උසාවි දඩ ආදායම 2012 සැප්තැම්බර් මාසයෙන් පසුව හා ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය මඟින් ලැබිය යුතු උසාවි දඩ ආදායම 2012 ජූනි මාසයෙන් පසු හඳුනා ගැනීමට හෝ සභාවට අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වන 2014 ජනවාරි 24 දින වන විටත් ගෙන නොතිබුණි.

2.3.4 දැන්වීම් පුවරු ගාස්තු

---------------------------

සභා බල ප්‍රදේශය තුල පිහිටුවා ඇති නීත්‍යානුකූලව ගාස්තු අයකල හැකි දැන්වීම් පුවරු සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122 හා 126 වගන්ති වල විධිවිධාන අනුව අදාල ගාස්තු අයකර නොතිබුණි.

2.3.5 දුරකථන කුළුණු ගාස්තු

----------------------------

සභා බල ප්‍රදේශයේ පිහිටුවා තිබූ සියළු දුරකථන කුළුණු සඳහා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි V වන උපලේඛණයේ පනවා තිබූ නියමයන් අනුව කිසිඳු ගාස්තු අය කිරීමක් සිදු කර නොතිබුණි.

2.3.6 සතිපොල බදු

-----------------

වැලිගෙපොල සතිපොල 2013 වර්ෂය සඳහා බදුගත් බදුකරුගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 51,240 ක හිඟ ශේෂයක් අයකරගත යුතුව තිබුණි. ටෙන්ඩර් ඇප තැන්පත් මුදලින් රු. 33,600 ක් පියවා ගැනීමෙන් පසුව ඉතිරි රු. 17,640 ක මුදල වාර්තාවේ දින වනවිටද පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2014 වර්ෂය සඳහාද වැලිගෙපොල සතිපොල උක්ත බදුකරුටම බදුදී පවත්වා ගෙන යනු ලබන අතර, 2014 වර්ෂය සඳහා ටෙන්ඩර් ඇප තැන්පත් මුදල්ද අයකර ගැනීමට පරීක්ෂණ දිනය දක්වා කටයුතු කර නොතිබුණි

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නව ජල ව්‍යාපෘතියකට අවශ්‍ය උපාංග මිලදී ගැනීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් සමාලෝචිත වර්ෂය තුල රු. 205,175 ක් වැය කර තිබූ අතර, උක්ත මිලදී ගැනීම සඳහා මිල කමිටුව නිර්දේශ ලබා ගැනීමට යොමුකර නොමැති බවත්, ලියාපදිංචි සැපයුම්කරුවන් මඟින් හෝ මිලදී ගැනීම් සිදුකර නොතිබුණි.

(ආ) මිලදීගනු ලබන භාණ්ඩය පිළිබඳ නිර්ණායක පිළිබඳව කාර්මික නිළධාරීගේ ඇස්තමේන්තුවකින් හෝ නිර්දේශයකින් තොරව අවස්ථා 04 කදී රු. 943,250 ක් වටිනාකමැති ජල මීටර් 350 ක් සමාලෝචිත වර්ෂයේදි මිලදී ගෙන තිබූ අතර, තොග ලේඛණයට අනුව ජල මීටර් 30 ක් ගබඩාවේ තිබිය යුතු වුවද, ජල මීටර් කිසිවක් ගබඩාවේ නොමැති බව 2014 ජනවාරි 23 දින කරනු ලැබූ භෞතික පරීකෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී, කාර්යාලයේ පරිගණක සහ අභ්‍යන්තර දුරකථන ජාලගත කිරීම සඳහා රු.154,800 ක් වැයකර තිබුණි. නිසි පරිදි සභාවේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමකින් තොරව සහ පිරිවිතරයන් සකස් කර ටෙන්ඩරය ඇගයීමකට ලක් කිරීමකින් තොරව ටෙන්ඩර් කැඳවීම් සිදුකර තිබුණි. ජාල පද්ධතිය නිසි ගුණත්වයෙන් යුක්ත බවට විදුලි සංදේශ පද්ධති පිළිබඳ ඉංජිනේරුවරයෙකුගෙන් සහතික කර ගැනීමක් සිදුකර නොතිබුණි. මිලදී ගැනීම් ක්‍රියාපටිපාටියේ දුර්වලතා හේතුවෙන් ස්ථාපිත කර ඇති ජාලය විටින්විට බිඳවැටීම් සිදුවන අතර, එම ජාලයෙන් සභාවට ලබා ගැනීමට අපේක්ෂා කල සේවාව ලබා ගැනීමට අපහසු වී තිබුණි.

(ඈ) එල්එෆ්-4847 අංක දරන කැබ් රථය 2013 අගෝස්තු 30 දින සිට ධාවනයෙන් ඉවත් කර ඇති අතර, 2013 අගෝස්තු 21 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) වෙතින් වාහනයේ තත්ත්වය පිළිබඳව වාර්තාවක් ලබාගෙන තිබුණද, අළුත්වැඩියාව සිදු කර නොතිබුණි. සභාව සතු කැබ් රථ දෙකක් තිබියදී කුළී රථ සඳහා ප්‍රවාහන ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේදි රු. 137,837 ක වියදමක් දරා තිබුණි.

(ඉ) දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් උතුරු හුණුවල හා පැලැන්කන්ද ජල යෝජනා ක්‍රමය සඳහා ලබාගත් ණය මුදලේ පළමු හා දෙවන අදියරයන් වෙනුවෙන් ඉකුත් වර්ෂයන්ට හා සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතුව තිබූ එකතුව රු. 1,988,156 ක වාරික මුදල් ගෙවීමට පියවර ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

3.2.1 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්
--------------------------------------

2013 වර්ෂය වනවිට ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කරන ලද ට්‍රැක්ටර් රථ දෙකක් හා කැබ් රථයක් විගණන දිනය වූ 2014 ජනවාරි 24 දින වනවිටත් සභා පරිශ්‍රයේ නිෂ්කාර්යයව ගාල්කර තිබුණි.

3.2.2 කොන්ත්‍රාත් පරිපාලනය

මගනැගුම ව්‍යපෘතිය සම්බන්ධයෙන් 2014 පෙබරවාරි 27 දින සිදුකරන ලද භෞතික පරික්ෂාවේදි පහත කරුණු අනාවරණය විය.

| | මගනැගුම ව්‍යපෘතිය | නිරික්ෂණය |
|---|---|---|
| (i) | කයිකාරගොඩ මාර්ගයට කොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරීම. | මාර්ගයට කඩා වැටුනු පස් ඉවුරක් හේතුවෙන් මාර්ගයේ ඉදිකිරිම් අත්හැර දමා තිබුණි. |
| (ii) | උඩවෙලේගොඩ මාර්ගය කොන්ක්‍රිට් කුට්ටිගල් ඇතිරිම. | නිමකල මාර්ගයේ කොටසක කොන්ක්‍රිට් කුට්ටි ගිලා බැස තිබුණි. |
| (iii) | මාදොල අඹගහවත්ත මාර්ගය කොන්ක්‍රිට් කුට්ටිගල් ඇතිරිම | කොන්ක්‍රිට් කුට්ටි පිළිබඳ තත්ත්ව පරික්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි. |
| (iv) | මාදොල අඹගහවත්ත මාර්ගය කොන්ක්‍රිට් කුට්ටිගල් ඇතිරිම. | මාර්ගය ආරම්භයේ අවම පළල අඩි 8 ක් නොතිබුණි. |

මහ නැගුම ව්‍යාපෘති යටතේ මල්මීකන්ද සුදුහීන්කන්ද මාර්ගය (I අදියර) සංවර්ධනය කිරීම සඳහා වන රු. 500,000 ක ප්‍රතිපාදන මත පොල්වත්තහේන ගොවි සංවිධානය සමඟ 2013 සැප්තැම්බර් 02 දින ගිවිසුම්ගත කාලය මාස 2 දින 28 ක් සඳහා ගිවිසුම්ගතවී තිබුණි. 2013 නොවැම්බර් 30 දිනට පෙර වැඩ නිමකර භාර දුන් බවට වැඩනිමි වාර්තාව සහ මිනුම් වාර්තා සකසා ඉදිරිපත් කර තිබූ නමුත්, ඉටු නොකරන ලද මීටර් 1.9 ක් සඳහාද අදාල කොටස් ඉටුකල බවට බිල්පත් සකසා ඉදිරිපත් කර තිබූ බව 2014 ජනවාරි 27 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී තහවුරු වුණි

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

1988 (ප්‍රාදේශිය සභා ) මූල්‍ය පරිපාලන රීතී මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි

4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 38 කට අදාලව වෙන් කරන ලද ප්‍රතිපාදන රු. 4,899,049 ක් ඉතිරි වී තිබුණි.

5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) අයවැය පාලනය
(iv) කොන්ත්‍රාත් පාලනය